| 05-12-2025 | උදෑසන මුරලි | ඕම් ශාන්ති | බාප්දාදා | මධුබන් |
|---|---|---|---|---|

**සාරය:** සුමිහිරි දරුවනි, මෙම අපවිත්‍ර ලෝකය, පැරණි ගම්මානයකි. එය ඔබට ජීවත් වීමට තරම් වටින්නේ නැත. ඔබ දැන් පිවිතුරු නව ලෝකයට යා යුතුයි.

**ප්‍රශ්නය:** ඔවුන්ගේ දියුණුව සඳහා පරමාත්ම පියා ඔහුගේ දරුවන්ට පවසන එක් ක්‍රම-වේදය කුමක්ද?

**පිළිතුර:** දරුවනි, කීකරු වී දිගටම පරම පියාගේ උපදෙස් පිළිපදින්න. බාප් සහ දාදා සිටින්නේ එකටයි. එබැවින්, ඔහුගේ (බ්‍රහ්ම) උපදෙස් වලින් යම් කිසි හානියක් සිදුවන්නේ නම්, පියා වගකීම භාර ගන්නා අතර, ඔහු සෑම දෙයක්ම නිවැරදි කරයි. ඔබ තමන්ගේම උපදෙස් භාවිත නොකළ යුතුයි. මේවා ශිව බාබාගේ උපදෙස් බව සලකමින් දිගටම ඉදිරියට යන්න, එවිට විශාල ප්‍රගතියක් ඇතිවෙයි.

ඕම් ශාන්ති. ආධ්‍යාත්මික පියා, ආධ්‍යාත්මික දරුවන්ට විස්තර කර දෙන ප්‍රධානතම දේ වන්නේ : තමන් ජීවාත්ම යන විශ්වාසයෙන් මෙතැන අසුන් ගෙන පරමාත්ම පියාව සිහිපත් කරන්න, එවිට ඔබගේ සියලු දුක් නැතිවී යයි. ඒ මිනිසුන් ආශිර්වාද ලබා දෙයි. පරමාත්ම පියා පවසන්නේ දරුවනි, ඔබගේ සියලු දුක් නැති වී යයි තමන් ජීවාත්ම බව සලකා, පරමාත්ම පියා සිහිපත් කරන්න, එපමණයි. මෙය ඉතාමත්ම පහසුයි. මෙය භාරතයේ පහසු පෞරාණික රාජයෝගාවයි. ඔබ 'පෞරාණික' යැයි කියන නමුත් කාල වනවානුවක් තිබිය යුතුයි. ඔබ 'ඉතා දීර්ඝ කාලයකට පෙර' යැයි කීවද, එය කෙතරම් කාලයකට පෙරද? පරම පියා විස්තර කරන්නේ මම හිරියටම වසර 5000 කට පෙර ඔබට රාජයෝගාව ඉගැන්වූවා. පියා හැර වෙනත් කිසිවෙකුට විස්තර කළ නොහැකි අතර, දරුවන් හැර වෙනත් කිසිවෙකුට මෙය වටහා ගත නොහැක. ජීවාත්ම, දරුවන්, පරමාත්ම පියා, පරමාත්ම ජීවයෙන් දීර්ඝ කාලයක් වෙන්ව සිටි බව, සිහිකර ඇත. පරමාත්ම පියා මෙසේද පවසයි ඉනිමඟ දිගේ පහළට පැමිණෙන අතර, ඔබ අපවිත්‍ර විය. ඔබට දැන් සෑම දෙයක්ම සිහි වෙයි. සෑම කෙනෙක්ම කන්නලව් කරන්නේ අහෝ පාරිශුද්ධකරුවාණෙනි! කලි යුගයේ සිටින්නේ අපවිත්‍ර ජීවාත්ම පමණයි. ස්වර්ණමය යුගයේ සිටින්නේ පිවිතුරු ජීවාත්ම පමණයි. එය පිවිතුරු ලෝකයයි. මෙම පැරණි අපවිත්‍ර ලෝකය, ඔබට ජීවත් වීමට තරම් නොවටින්නේය. කෙසේවෙතත්, මායාගේ බලපෑම ද අඩු නැත. ඔවුන් මහල් 100 සිට 125 දක්වා ඇති ගොඩනැගිලි තනන බව ඔබට දැක ගත හැක. මෙය මායාගේ පම්පෝරිය බව කියැවෙයි. මායාගේ ශෝභාව කෙතරම්ද කියතොත්, ඔබ කෙනෙකුට දිව්‍ය ලෝකයට යාමට ආරාධනා කළත්, ඔහුට මෙහි දිව්‍ය ලෝකය බව ඔහු පවසයි. මෙයට මායාගේ ශෝභනය යැයි කියයි. කෙසේවෙතත්, මෙය පැරණි ගම්මානයක් බව ඔය දරුවන්ට වැටහෙයි. එයට කියන්නේ අපාය, පැරණි ලෝකය, එයින්ද අපායේ අන්ත අගාධය යැයි කියයි. ස්වර්ණමය යුගයට, දිව්‍ය ලෝකය යැයි කියයි. මෙම වදන් දැනටමත් භාවිත කරයි. සෑම කෙනෙක්ම මෙයට දූෂිත ලෝකය යැයි කියයි. දිව්‍ය ලෝකය, දූෂණයෙන් තොර ලෝකය විය. දිව්‍ය ලෝකයට දූෂණයෙන් තොර ලෝකය කියාද, අපායට, දූෂිත ලෝකය යැයිද කියයි. මෙතරම් සරළ දෙයක්, කිසිවෙකුගේ බුද්ධියේ සනිටුහන් නොවන්නේ ඇයි? මනුෂ්‍යයන් බොහෝ දුක් විඳිති! බොහෝ යුද්ධ මෙන්ම බොහෝ ගැටුම් දිගටම සිදුවනවා. දිනෙන් දින, ඔවුන් කෙබඳු බෝම්බ නිපදවන්නේද යත්, ඒවා බිම හෙලූ සැනින් මිනිසුන් මිය යයි. කෙසේවෙතත, දැන් සිදු වීමට යන්නේ කුමක්ද කියා, පහත් බුද්ධි ඇති මිනිසුන්ට නොවැටහෙයි. සිදු වීමට යන්නේ කුමක්ද කියා විස්තර කළ හැක්කේ වෙනත් කිසිවෙකුට නොව පරමාත්ම පියාට පමණයි. නව ලෝකය අදෘෂ්‍යමාන අන්දමකින් ස්ථාපිත වන අතර, ඉන්පසුව පැරණි ලෝකය විනාශ වීමට යනවා. ඔය දරුවන්ට අදෘෂ්‍යමාන සටන්කාමීන් යැයි කියයි. ඔබ යුධ වැදී සිටින බව කිසිම කෙනෙකුට වැටහෙනවාද? ඔබගේ යුද්ධය තිබෙන්නේ අවගුණ පහ සමඟයි. ඔබ සෑම කෙනෙකුටම පිවිතුරු වීමට කියා පවසයි. ඔබ සෑම කෙනෙක්ම, එක් පරම පියාගේ දරුවන්ය. ප්‍රජාපිතා බ්‍රහ්මගේ දරුවන් සියල්ලම, සහෝදර, සහෝදරියන්ය. ඔබ නිවැරදි අන්දමින් විස්තර කළ යුතුයි. ප්‍රජාපිතා බ්‍රහ්මට එක් කෙනෙක් පමණක් නොවෙයි, බොහෝ දරුවන් සිටියි. ඔහුගේ නාමයම වන්නේ ප්‍රජාවගේ පියාය (ප්‍රජාපිතා). භෞතික පියෙකුට කිසිදාක ප්‍රජාවගේ පියා යැයි නොකියයි. ප්‍රජාපිතා සිටින බැවින්, ඔහුගේ දරුවන් සියලු දෙනාම සහෝදර, සහෝදරියන්, බ්‍රහ්ම කුමර, කුමරියන් විය යුතුයි. කෙසේවෙතත්, ඔවුන්ට මෙය වැටහෙන්නේ නැත. ඔවුන්ගේ බුද්ධි ගල් වැනිය ඔවුන් වටහාගැනීමට උත්සාහ දරන්නේවත් නැත. ප්‍රජාපිතා බ්‍රහ්මගේ දරුවන් සියල්ලම සහෝදර, සහෝදරියන්ය ඔවුන්ට පාපයේ ගැලිය නොහැක. පුවරුවේ 'ප්‍රජාපිතා' යන වචනය තිබීම අවශ්‍යයි. ඔබ අනිවාර්යෙන්ම මෙම වචනය ලිවිය යුතුයි. 'බ්‍රහ්ම' කියා පමණක් ලිවීමෙන්, එතරම් බලපෑමක් නැත. එබැවින්

දැන්වීම් පුවරුවල නිවැරදි වචන ලිවිය යුතුයි. මෙය බොහෝ සෙයින් අවශ්‍යයි. බ්‍රහ්ම යන නම, ස්ත්‍රීන්ට පවා ඇත. ඔවුන්ට නම් වල හිඟයක් ඇති වී තිබෙන නිසා, පිරිමින්ගේ නම්, ස්ත්‍රීන්ටද ලබා දී තිබේ. මෙතරම් නම් ඔවුන් කොහේ සිට ගෙනෙන්නද? සෑම දෙයක්ම සිදුවන්නේ නාටකයේ සැලසුමට අනුවයි. පියාට විශ්වාසනීය සහ කීකරු වීම, ඔබගේ නැන්දම්මාගේ ගෙදර යනවා වගේ නොවෙයි! බාප් සහ දාදා සිටින්නේ එකටයි. කතා කරන්නේ කවුරුන්ද කියා ඔබට කිව නොහැක. මේ නිසයි ශිව බාබා පවසන්නේ මිනිසුන්ට මගේ උපදෙස්වත් වටහා ගැනීමට නොහැක. ඔබට නිවැරදි හෝ වැරදි දෙයක් කීවත්, එය සෑම විටම ඔබට පවසන්නේ ශිව බාබා බව සලකන්න, එවිට ඔහු එහි වගකීම දරයි. මෙම කෙනා හානියක් සිදුවන යමක් කීවත්, එම කෙනා වගකීම දරන බැවින්, ඔහු සෑම දෙයක්ම නිවැරදි කරයි. ඒවා ශිව බාබාගේ උපදෙස් බව දිගටම සලකන්න, එවිට බොහෝ ප්‍රගතියක් ඇතිවෙයි. කෙසේවෙතත්, සමහරුන්ට වටහාගැනීමට අපහසු බවක් දැනෙයි. ඔබගෙන් සමහරෙක් එවිට තමන්ගේම උපදෙස් දිගින් දිගටම අනුගමනය කරයි. පරමාත්ම පියා ඔය දරුවන්ට උපදෙස් දීමට සහ ඔබට විස්තර කිරීමට, බොහෝ දුර සිට පැමිණෙයි. වෙනත් කිසිම කෙනෙකුට මෙම ආධ්‍යාත්මික දැනුම නොමැත. මුළු දවස පුරාම මෙය ගැන සිතන්න. මිනිසුන්ට වටහා ගැනීමට හැකි වන පරිදි, ඔබ ලිවිය යුත්තේ මොනවාද? මිනිසුන්ගේ දෘෂ්ටිය එය මත වැටෙන අන්දමින් ඔබ බොහෝ සරළ වදන් ලිවිය යුතුයි. කිසිවෙකුට ප්‍රශ්න ඇසීමට අවශ්‍ය නොවන, එවන් ආකාරයකින් ඔබ විස්තර කළ යුතුයි. පරමාත්ම පියා මෙසේ පවසන බව, ඔවුන්ට කියන්න තමන් ජීවාත්මයක් බව සලකා, මා සිහිපත් කරන්න, එවිට ඔබගේ සියලු දුක් ඉවත් වෙයි. ඉතා හොඳින් සිහිපත් කිරීමේ සිටින අය, උසස් තත්ත්වයක් ලබා ගනීවි. මෙය එක් තත්පරයක කාරණාවකි. මිනිසුන් බොහෝ විවිධ අන්දමේ ප්‍රශ්න අසයි ඔබ ඒ සියල්ලට පිළිතුරු නොදිය යුතුයි. ඔවුන්ට කියන්න වැඩිය ප්‍රශ්න අහන්න එපා! පළමුවෙන්ම එක් දෙයක් ගැන විශ්වාසයක් තබන්න! ඔබ ප්‍රශ්න කැලයක සිරගත වුණොත්, ඔබට නැවත පිටවීමට පාර සොයාගැනීමට නොහැකි වෙයි. එය මිනිසුන් ඝණ මීදුමක අසු වූ විට ඔවුන්ට පාර සොයා ගැනීමට අපහසු වන ආකාරයෙනි. මෙහිද එසේමයි. මිනිසුන් බොහෝ සෙයින් මායා තුළ සිරගත වෙයි. එබැවින් පළමුවෙන් සෑම කෙනෙකුටම එක් දෙයක් කියන්න ඔබ අවිනාශී ජීවාත්මයක්. පරමාත්ම පියාද අවිනාශී වන අතර පාරිශුද්ධකරුය. ඔබ අපවිත්‍රයි. දැන් ඔබ ආපසු නිවහනට එසේ නැත්නම් නව ලෝකයට යා යුතුයි. අවසානය දක්වාම ජීවාත්ම, දිගින් දිගටම පැරණි ලෝකයට පහළට පැමිණෙයි. සම්පූර්ණයෙන් ඉගෙන නොගන්නා අය, නිසැකයෙන්ම අවසානයේදී පැමිණෙනු ඇත. ගිණුම පැහැදිලිය, එමෙන්ම සෑම කෙනෙක්ම කෙතරම් ඉගෙනගන්නේද, ඒ අනුව, කවුරුන් පළමුව පැමිණෙයිද කියා වටහා ගැනීමට පුළුවනි. මෙය පාසැලකද දැකිය හැක. අරමුණට දිව යන්න, එය අල්ලා ආපසු පැමිණෙන්න! පළමුව ආපසු පැමිණෙන කෙනාට තෑග්ගක් ලැබෙයි. මෙම කාරණාව අසීමිතයි. ඔබට ලැබෙන තෑග්ග අසීමිතයි. පරමාත්ම පියා පවසන්නේ සිහිපත් කිරීමේ වන්දනාවේ සිටින්න. ඔබ දිව්‍යමය ගුණධර්ම ධාරණය කරගත යුතුයි. ඔබ සියලුම ගුණධර්ම වලින් පිරිය යුත්තේ මෙහිදිය, ඔබට වාර්තාවක් තබා ගැනීමට කියා බාබා ඔබට කියන්නේ මේ නිසාය. සිහිපත් කිරීමේ වන්දනාව ගැන වාර්තාවක් තබා ගන්න, එවිට ඔබ ලාභයක් ලබන්නේද පාඩු ලබන්නේද කියා ඔබට වටහා ගැනීමට හැකි වෙයි. කෙසේවෙතත්, සමහර දරුවන් එය නොලියයි. බාබා, ඔය දරුවන්ට මෙය කිරීමට කියන නමුත්, ඔබ එය නොකරයි. එය කරන්නේ ඉතාමත්ම ටික දෙනෙක් වන අතර, ටික දෙනෙකුගෙන් පමණක් මාලාව නිර්මාණය වන්නේ මේ නිසාය. ඉහළම ශිෂ්‍යත්වය අට දෙනෙකුට හිමි වන අතර ඉන්පසුව 108 දෙනෙකුට ධන ලකුණු ලැබෙයි. ධන ලකුණු හිමි කරගන්නේ කවුද? අධිරාජවරුන් සහ අධිරාජිනියන් වීමට ඇති අය. ඇත්තේ ඉතා සුළු වෙනසක් පමණයි. පරම පියා පවසන්නේ පළමුව තමන් ජීවාත්මයක් බව සලකා, පරමාත්ම පියා සිහිපත් කරන්න! සිහිපත් කිරීමේ වන්දනා ගමන මෙයයි. පරම පියාගේ මෙම පණිවිඩය ලබා දෙන්න, එපමණයි. වැඩිපුර කතා කිරීමට අවශ්‍ය නැත. මන්මනභව කියා සරළව පවසන්න! සියලුම ශාරීරික නෑදෑයින් අත්හරින්න! බුද්ධියෙන් පැරණි ලෝකයේ සියල්ලන්ව ඉවත් කරගන්න, මන්ද ඔබ දැන් අශාරීරික වී ආපසු නිවසට යා යුතු බැවින්. මෙහිදි බාබා ඔබට මතක් කර දෙන නමුත්, දවස පුරාම ඔබ බාබාව සිහිපත් නොකරන අතර එවිට ඔබ ශ්‍රීමත්ද අනුගමනය නොකරයි එය ඔබගේ බුද්ධිය තුළ තැන්පත් වන්නේ නැත. පරම පියා පවසන්නේ ඔබට නව ලෝකයට යාමට අවශ්‍ය නම්, තමෝප්‍රධාන් බවින් සතෝප්‍රධාන් වන්න. බාබා ඔබට ඔබගේ රාජධානියේ භාග්‍යය ලබා දුන් නමුත්, ඔබ උපත් 84 ගන්නා අතර, එය නැති කර ගත්තේය. වසර සිය දහස් ගණනක් පිළිබඳ ප්‍රශ්නයක් නැත. ඔවුන් ඇල්ෆාව නොදන්නා බැවින් බොහෝ දෙනෙක් දිගටම බොහෝ ප්‍රශ්න අසයි. පරම පියා පවසන්නේ පළමුව, නිරතුරුවම මා පමණක් සිහිපත් කරන්න, එවිට ඔබගේ පාපයන් කැපී යනු ඇත. තවද දිව්‍යමය ගුණදම්ද ධාරණය කරගන්න, එවිට ඔබ දේවතාවන් වෙයි. වෙනත් කිසිවක් අසන්නට අවශ්‍ය නැත. ඔවුන් ඇල්ෆා වටහා නොගෙන, නිකම්ම බීටා සහ තීටා ගැන දිගින් දිගටම කතා කරන විට, ඔබත් අවුල් වී

අසහනයට පත්වෙයි. පරමාත්ම පියා පවසන්නේ පළමුව ඇල්ෆා වටහාගැනීමෙන්, ඔබට සෑම දෙයක්ම වැටහෙයි. ඔබ මගේ මාර්ගයෙන්, මා ගැන වටහා ගැනීමෙන්, සෑම දෙයක්ම වටහාගනී. ඔබට වටහා ගැනීමට කිසිවක් ඉතිරි නොවනු ඇත. ඔබට දින හතක් ලබා දෙන්නේ මේ නිසාය. ඔබට දින හතක් තුළදී විශාල ප්‍රමාණයක් වටහා ගැනීමට පුළුවනි. කෙසේවෙතත්, මෙය වටහා ගන්නා අයද අංකානුරූපයි. සමහරුන්ට කිසිම දෙයක් නොවැටහෙයි. ඔවුන් රජවරුන් හෝ රැජිණියන් වන්නේ කෙසේද? ඔවුන් එක් අයෙක් පමණක් පාලනය කරයිද? සෑම කෙනෙක්ම තමන්ගේ පුරවැසියන් නිර්මාණය කළ යුතුයි. බොහෝ කාලය අපතේ හැරෙයි. ඔවුන් දුගී මෙන්ම අසරණ බව, පරම පියා පවසයි. කෙතරම් උසස් තත්ත්වයක් ඔවුන්ට තිබුණත්, ඒ සියල්ලම දුහුවිලි බවට හැරීමට යන බව පරමාත්ම පියා දන්නවා. ඉතිරිව තිබෙන්නේ ටික කාලයයි. විනාශ කාලයේ, සෙනෙහෙස නොමැති බුද්ධි ඇති අය, විනාශ වෙයි. ජීවාත්ම වන අපට බොහෝ සෙනෙහස ඇති බුද්ධි තිබෙන බව, ඔබට වටහාගැනීමට පුළුවන්. ඇතැමුන් පවසන්නේ ඔවුන්ට සිහිපත් කිරීමේ සිටීමට හැකි වන්නේ පැය එකක් හෝ දෙකක් පමණක් බව. ඔබගේ භෞතික පියාට ඔබ ආදරය කරන්නේ පැය එකක් හෝ දෙකක් පමණද? ඔබ දවස පුරාම දිගටම 'බාබා, බාබා' යැයි කියයි. මෙහිදී ඔබ 'බාබා, බාබා' කියා කියන නමුත්, එම ගැඹුරු සෙනෙහස නොමැත. ඔබට නැවත නැවතත් කියන්නේ ශිව බාබාව සිහිපත් කරන ලෙසයි. ඔබට සත්‍ය සිහිපත් කිරීම තිබිය යුතුයි. මෙහිදී ඔබ වුවමනාවට වඩා පණ්ඩිත නොවිය යුතුයි. මා බොහෝ සෙයින් ශිව බාබාව සිහි කරනවා යැයි කියන බොහෝ දෙනෙක් සිටියි. එසේ නම් ඔවුන් පියාසර කරමින් සිටිය යුතුයි බාබා, මා දැන් බොහෝ දෙනෙකුට යහපතක් සිදු කිරීමට සේවය සඳහා යන්නෙමි. ඔබ මෙම පණිවිඩය මිනිසුන් වැඩි දෙනෙකුට දෙන්නේද, ඒ අනුව ඔබ වැඩියෙන් සිහි කිරීමේ සිටිනවා ඇති. බොහෝ දියණියන් පවසන්නේ ඔවුන් බන්දන වල සිටින බවයි. කෙසේවෙතත්, මුළු ලෝකයම තිබෙන්නේ බන්දනයකයි! බන්දන, උපායශීලිව කපා දැමිය යුතුයි. බොහෝ ක්‍රම තිබේ. නිදසුනක් වශයෙන්, ඔබ හෙට මිය යන්නේ නම්, ඔබගේ දරුවන් රැක බලාගන්නේ කවුරුන්ද? අනිවාර්යෙන්ම ඔවුන්ව රැක බලාගැනීමට කවුරුන් හෝ මතුවනු ඇති. අඥාන මාවතේ නම්, ඔබ ඇතැම් විට නැවත විවාහ වනු ඇත. මෙකල, නැවත විවාහ වීම විශාල ගැටළුවකි. යමෙකුට මුදල් ටිකක් දී, එම කෙනාට දරුවන් බලා ගන්නට කියා පවසන්න. මෙය ඔබ ජීවමානව මියැදෙන උපතයි. ඔබ ජීවමානව මියැදෙන විට, ඔබ වෙනුවෙන් සෑම දෙයක්ම රැක බලාගන්නේ කවුද? නිසැකයෙන්ම සාත්තුවට කෙනෙක් සේවයට ගැනීමට සිදුවෙයි. මුදල් වලින් කළ නොහැක්කේ මොනවාද? ඔබ අනිවාර්යෙන්ම බන්දනයන්ගෙන් නිදහස් විය යුතුයි. සේවය කිරීමට විශාල උනන්දුවක් ඇති අය, සේවය සඳහා දිව යනු ඇත ඔවුන් ලෝකයට මිය ගොසින්ය. මෙහිදී පරම පියා පවසන්නේ ඔබගේ මිතුරන් සහ නෑදැයින්වත් ඔබ අනිවාර්යෙන්ම ඉහළ නැංවිය යුතුයි. ඔවුන් තමෝප්‍රධාන් බවින් සතෝප්‍රධාන් වන අන්දමින්, සෑම කෙනෙකුටම 'මන්මනභව' යන පණිවුඩය ලබා දෙන්න. ඔබට මෙය පවසන්නේ, පරමාත්ම පියා පමණයි. අන් සෑම කෙනෙක්ම ඉහළ සිට පහළට පැමිණෙයි. ඔවුන්ගේ අනුගාමිකයන්ද ඔවුන්ගේ පසුපස දිගින් දිගටම පහළට පැමිණෙයි. නිදසුනක් ලෙසින්, ක්‍රිස්තුස්වහන්සේ සෑම කෙනෙක්වම පහළට ගෙන ආවා. මෙහි පහළ, ඔවුන්ගේ චරිත කොටස් රඟපෑම නිසා ඔවුන් අසාමයට පත් වූ විට, ඔවුන්ට සාමය අවශ්‍ය බව ඔවුන් පවසයි. ඔවුන් සාමයෙන් අසුන්ගෙන සිටි අතර, ඉන්පසුව ඔවුන්ගේ ආගමික නිර්මාතෘ පසුපස, ඔවුන් මෙහි පහළට පැමිණියා. ඉන්පසුව ඔවුන් කන්නලව් කරන්නේ අහෝ පාරිශුද්ධකරුවාණෙනි පැමිණෙන්න! බලන්න, නාටකය සෑදී ඇති අන්දම දෙස! ඔවුන්ගේ අරමුණ ඉටු කරගැනීමට ඔවුන් අවසානයේදී පැමිණෙයි. සමහර දරුවන්ට දර්ශන ලැබී ඇත. ඔවුන් පැමිණ, ඔවුන්ගේ 'මන්මනභව' වීමේ අරමුණ ඉටු කරගනී. ඔබ දැන් යාචකයන්ගෙන් රජකුමරුන් බවට පරිවර්තනය වෙමින් සිටිනවා. මෙකල ධනවත් අය, පසුව යාචකයන් වෙයි. එය විශ්මයකි! කිසි කෙනෙක් මෙම නාටකය ගැන කිසිම දෙයක් දන්නේ නැත. මුළු රාජධානියම ස්ථාපිත වෙනවා. එහි දුප්පත් අය සමහරෙක්ද සිටිනවා ඇති, නොවේද? මෙය වටහා ගැනීමට බොහෝ දුර දක්නා බුද්ධියක් අවශ්‍ය වෙයි. ඔබ සියලු දෙනාම මාරු වී යන්නේ කෙසේද කියා අවසානයේදී ඔබට දර්ශන ලැබෙයි. ඔබ ඉගෙන ගන්නේ නව ලෝකයටයි. ඔබ දැන් සිටින්නේ සංගමයේය. ඔබ ඉගෙනගන්නා විට ඔබ සමත් වන අතර, ඉන්පසුව ඔබ දේවතා වංශයට යනු ඇත. වර්තමානයේ ඔබ සිටින්නේ බ්‍රහ්මණ වංශයේය. වෙනත් කිසි කෙනෙකුට මෙම දේවල් වටහා ගැනීමට නුපුළුවන. උගන්වන්නේ පරමාත්ම දෙවියන් බව, කිසිම කෙනෙකුගේ බුද්ධියේ සුළුවෙන් හෝ සනිටුහන් වන්නේ නැත. අශාරීරික පරමාත්ම දෙවියන් අනිවාර්යෙන්ම මෙහි පැමිණෙයි. මෙම නාටකය, ඉතාමත්ම ආශ්චර්යමත් ආකාරයකට නිර්මාණය වී ඇත. ඔබට නාටකය වැටහෙන අතර ඔබගේ චරිත කොටස් ඔබ රඟපායි. බ්‍රහ්මගේ මාර්ගයෙන් ස්ථාපනය සිදුවන බව විස්තර කිරීම සඳහා, ඔබ බ්‍රහ්මගේ පිංතූරය භාවිත කළ යුතුයි. විනාශය ඉබේටම සිදුවෙයි. ඔවුන් නිකමට නමක් දී ඇත. මෙම නාටකය පෙර නියම වූවක්. මලකඩ ඉවත් කරගැනීම සඳහා, ප්‍රධානතම දෙය වන්නේ, තමන්

ජීවාත්මයක් බව සලකා පරමාත්ම පියාව සිහිපත් කිරීමය. ඔබ පාසැලෙදී හොඳින් ඉගෙන ගන්නා තරමට, ඔබගේ ආදායම වැඩි වනු ඇත. ඔබට උපත් 21 කට නිරෝගිකම මෙන්ම ධනයද ලැබෙයි මෙය සුළු දෙයක් නොවෙයි! මෙහි කෙනෙකුට ධනය තිබෙන නමුත්, ඔහුගේ දරු මුනුපුරන්ට එය බුක්ති විඳිමට කාලයක් නොතිබෙයි. පියාට තිබුණු සෑම දෙයක්ම ඔහු මෙහි සේවය සඳහා භවිත කළා. එබැවින් ඔහු බොහෝ රැස්කර ගත්තේය! සෑම කෙනෙකුගේම ධනය රැස් නොවෙයි. කෝටිපතියන් බොහෝ දෙනෙක් සිටින නමුත් ඔවුන්ගේ ධනය භාවිත නොවෙයි. පරම පියා එය පිළි නොගනී, මන්ද, එසේ නම් ඔහුට එයට ආපසු ගෙවීමක් කිරීමට සිදුවෙයි. අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කලක් නැති වී සිට දැන් හමු වුණ දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. ඔබගේ බන්දන කපා දැමීමට ක්‍රම සාදා ගන්න. පරම පියා වෙනුවෙන් හදවතේ ගැඹුරු සෙනෙහසක් ඇති කරගන්න. සෑම කෙනෙකුටම පියාගේ පණිවිඩය ලබා දී, සෑම කෙනෙකුටම යහපතක් සිදුකරන්න.
2. දුර දක්නා බුද්ධියකින් මෙම අසීමිත නාටකය වටහාගන්න. යාචකයෙකුගෙන්, රජකුමරෙක් බවට පරිවර්ථනය වෙන මෙම ඉගෙනුමට, පූර්ණ අවධානය යොමු කරන්න. සිහිපත් කිරීමේ සත්‍ය වාර්තාවක් තබාගන්න.

**වරදානය:** ඔබේ සිතිවිලි බීජය සුබ පැතුම් වලින් පුරවා තබා ගැනීමෙන් ඔබ ලොවට යහපත සළසන්නෙකු වේවා.

**පාඨය:** **අව්‍යක්ත සංඥාව: දැන් සම්පූර්ණ හා කර්මතීත් වීමේ ගැඹුරු සැලකිල්ල ඇති කරගන්න.**

***** ඕම ශාන්ති *****

කර්මතීත් වීමට නම්, අශරීරික වීමේ පුරුද්ද වැඩි කරන්න. ශරීරයේ බන්ධනය, මිනිසුන්ගේ බන්ධනය, ද්‍රව්‍යමය සැප සම්පත් වල බන්ධනය, සොබාදහමේ සහ සංස්කාර වල බන්ධනය - ඒ කිසිම බන්ධනයකට ඔබව ආකර්ෂණය කර ගැනීමට ඉඩ නොදෙන්න. ජීවාත්මය මත තදින් බැඳී ඇත්තේ එම බන්ධනයන් ය. මේ සඳහා, නිරන්තරයෙන් ප්‍රතිශක්තිකරණය, එනම්, නොබැඳි හා සෙනෙහවන්ත වීමට පුරුදු වන්න.